සත්ත්ව විද්‍යාව

# කස්තූරි මුවා



## මෙම සතා නිකුත් කරන කස්තූරිවල වටිනාකම එදා රන් බරින් භාගයක් පමණ විය. අද එය කිලෝවක අන්තර්ජාතික මිල ඩොලර් 70,000 පමණ වේ. රන්වල බරට වඩා හතර ගුණයකින් පමණ වැඩි ය

මහාචාර්ය ලක්ෂ්මන් වෛද්‍යසේකර

කස්තූරි දේශීය වෛද්‍ය විද්‍යාවේත් ආයුර්වේදයේත් ඉතා වැදගත් තැනක් ගත්තා ඖෂධයකි. මෙය, අද වඳවී යන සතුන් විශේෂයක් ලෙස සලකන, පැරණි කල සිට ම මිහිතලයේ ජීවත්වන මුවන් විශේෂයක් වූ 'කස්තූරි මුවා' ගෙන් ලබාගන්නා දෙයකි. මෙම ඉතා වටිනා ඖෂධය මුවාගේ බඩ පෙදෙසේ පිහිටා ඇත. මෙම කරුණ නිසා එදා මෙම සතා මරා කස්තූරි ලබාගත් බව ප්‍රකට ය. පාසල් සිසුන් සහ අප කවුරුත් කුඩා කල සිට ම දන්නා අලගියවන්න මුකවෙටි පඬිතුමා විසින් රචිත සුභාෂිතයේ එක් කවියක ද සඳහන් වේ.

"නොහිම් සුවඳ විහිදෙන කස්තූරි නිමල
උතුම් මුව නැබෙහි තැබී බඹ නැණ විකල
විනම් මෙමට මහබඹු පදවි යම් කල
තබම් බොරු කියන දුදනන්ගෙ දිව මුල'

මෙහි අර්තය "මුවාගේ නැබෙහි මහ බඹු විසින් තබන ලද මේ අතිමධුර සුවඳ ඇති කස්තූරි මට මහබඹු පදවි ලදෙත් බොරු කියන දූර්ජනයන්ගේ දිව මුල තබමි" යන්න ය. මෙම ඖෂධය ලබා ගැනීම සඳහා බොරු කීමට දඬුවම් වශයෙන් ඒ අයගේ දිව මුල තැබීමෙන් විනාශ වේ යන මතයක් ඇත. එදා සිට අද දක්වා ම මේ අහිංසක මුවා මරා කස්තූරි ලබා ගැනීම සිරිත විය. එහෙත් අද භාරතයේ වඳවී යන මෙම සතා හදා වඩා ගැනීමට ස්ථාන ඇති කර ගොවිපලවල් ඇති කර සතුන් නොමරා විද්‍යානුකූලව කස්තූරි ලබා ගැනීම සිදුකරයි. 'කස්තූරි මුවා' ගේ සත්ත්ව විද්‍යාත්මක නම "මොස්චස් මොස්චිෆෙරස්' (*Moschus moschiferous*) ය. මෙම සතා මිනිස් වර්ගයාට ආර්ථික සෞන්දර්යාත්මක සමාජ ආගමික ක්‍රියාවලියක් වී ආදිකාලීනව පැවත එන්නෙකි. අන්තර්ජාතික සොබාදම් සංරක්ෂණ සංගමයේ (IUCN) රතු පොතෙ හි ද වඳවී යන සතෙක් ලෙස සඳහන් කර ඇත. මෙම වඳ වී යන සතුන් විනාශ කිරීම පරිසරයට කරන විශාල හානියක් ලෙස දැක් වේ.

මෙම සතා නිකුත් කරන කස්තූරිවල වටිනාකම එදා රන් බරින් භාගයක් පමණ විය. අද එය කිලෝවක අන්තර්ජාතික මිල ඩොලර් 70,000 පමණ වේ. රන්වල බරට වඩා හතර ගුණයකින් පමණ වැඩි ය. ඉන්දියානු රුපියල් මිලියන එකහමාරක් පමණ වේ. මෙම ප්‍රමාණය ගැනීම සඳහා මුවන් 150 ක් පමණ ඝාතනය කළ යුතු ය. කස්තූරි මුවා ව්‍යාප්තව ඇත්තේ පකිස්තානයේ හිමාල පෙදෙසේ සිට වයඹ දෙසටත් ඉන්දියාවේ අරුනාචල් ප්‍රදේශයටත් නේපාලයේ හිමාල පෙදෙසේ සිට චීනය, ටිබෙටය හා මොන්ගෝලියාවට ය. තව ද උතුරු සයිබීරියාවේ සිට රුසියාවේ උසුරින් තෙක් ය. මෙම සතා මියන්මාර් (බුරුමය) සහ කොරියානු අර්ධද්වීපයේ ද ඇති බව වාර්තා වේ. තව ද මෙම සතා සිකිම් ප්‍රදේශයේ වෙසෙන බවද වාර්තා වේ. වාසස්ථාන මීටර් 3000 පමණ උස් පෙදෙස්වල ය. භාරතයේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව විශේෂයෙන් ම ජම්මු හා කාශ්මීර ප්‍රදේශයේ වනලැහැබවල ය. හිමවල් ප්‍රදේශයේ ද උත්තර ප්‍රදේශයේ ද කඳුකර වනගැහැබ වල ය.

ආහාරය සඳහා විශේෂ ගස්වැල් හා ලයිකන යොදා ගනිති. සමහර සත්තු ගස්වැල් නොව ගස්වල පිපි මල් සහ පොහොට්ටු ආහාරයට ගනිති. ගස්වල පොතු ආශ්‍රිතව සෑදී ඇති ලයිකන මෙන් ම ඉඳලෝලු සහ හතුවර්ග කෑමට යොදා ගනී. වනයේ ජීවත්වන මෙම සත්තු ආහාරය සඳහා සරු පලතුරු වර්ග ද තෝරා බුදිති. ගොවිපලවල වැඩෙන සතුන් හදා වඩා ගැනීමට කිරි, පොහවන ලද කඩල, තිරිඟු යනාදිය ද තණකොල වර්ග කීපයක් ද ආහාර ලෙස ගන්නා බව විස්තර කර ඇත.

සතුන් බෝ කිරීම සඳහා යොදා ගන්නා මුව පට්ටි ගොවිපලවල ආරක්ෂා ලෙස තබා ගනී. 1950 සිට ම මෙවන් මුව ගොවිපලවල් රුසියාවේ සහ චීනයේ සාදා ඇත. මෙහිදී මෙම සතුන් මැරීමෙන් නොව විශේෂ තාක්ෂණික ක්‍රම අනුව පුරුෂ මුවන්ගේ නැබ ආශ්‍රිතව ඇති කස්තූරි ග්‍රන්ථිවලින් කස්තූරි ශ්‍රාවය වැස්සීම කර ගනී. මෙම ගොවිපලවල් ඉදි කර ඇත්තේ වෙනත් සතුන් සිටින ස්වභාවික පරිසරයට නුදුරින් ම ය. භාරතයේ මෙම සතුන් ඇති කිරීමේ ස්ථාන උසින් මීටර් 2500 පමණ වැඩි තැන් ය. කස්තූරි මුවන්ගේ හැසිරීම හා චර්යාව අනුව ස්ථාන යොදා ගනී. ඉන් එක් තැනක් නම් හිමවල් ප්‍රදේශයේ 'කුෆ්රි' කස්තූරි මුව ගොවිපල ය. තවෙකක් නම් උත්තර ප්‍රදේශයේ ගර්වාලි වල 'බරක්' මුව ගොවිපල ය. අනික උත්තර ප්‍රදේශයේ කුමාඋන්වල 'මොහුරි' මුව ගොවිපල ය. සතුනගේ ජීවන චක්‍රයට අදාල පර්යේෂණ ද මෙහිදී සිදු කරනු ලබයි. සතුන් ඇති කිරීම සඳහා සෙවිලි කරන ලද ලී වලින් සෑදී

කුඩා කුටි ඇත. විශේෂයෙන් ශීතල සෙන්ටිග්‍රේඩ් අංශක 15–20 දක්වා හිතවත් ය. ගොව්පල තුළ එක් එක් ස්ථාන දේශගුණික වෙනස්වීම් අනුව යොදා ගනී. කස්තූරි ඇති ගැටය පුරුෂ කස්තූරි මුවාගේ ඇත. පළමු වසර 3–4 කාලය තුළ කුඩා මුවන්ගේ දැක ගත හැක. නාබියට යටින් පිහිටා ඇත. කුඩා කල පොඩි බෙරි පල ගෙඩියක් ලෙස පෙනේ. තද ගතියක් නැත. සම්පූර්ණ වැඩීම අවුරුදු 2 1/2 සිට දක්නට හැකි ය. ලොකු ගැටයක් බරින් ග්‍රෑම් 40–70 දක්වා ය. මෙහි කස්තූරි සාරය තද දියරක් ලෙස ග්‍රෑම් 10–40 දක්වා ප්‍රමාණයක ඇත. සාමාන්‍යයෙන් වයස අවුරුදු 2 1/2 සිට 14 දක්වා කස්තූරි ලබා ගනී. කස්තූරි වරක් දෙවා ගැනීමෙන් පසු නැවත ඇතිවන්නේ නැතහොත් ගැටිති පිරීම සිදුවන්නේ මාස 6 කට පසුව ය. මුලු ජීවිත කාලය වන වසර 16 කදී ග්‍රෑම් 360 පමණ ලබා ගත හැකි බව ගණන් බලා ඇත. සතුන් හදා වඩා ගැනීමේ දී කිසිදු කරදරයක් නොමැතිව හෝ මැරීමක් නොමැතිව කස්තූරි ලබා ගත හැක. එක්කෝ නිර්වින්දන ක්‍රියාවක් සිදු කිරීමෙන් හෝ එකතැනක සීරුවෙන් තබා ගැනීමෙන් ලබා ගත හැකි ය. නැබ අසල ඇති ගැටිවල සිදුරකින් මිරිකීමෙන් කස්තූරි දෙවා ගත හැක. මේ අනුව වසරකට දෙවරක් දෙවා ගත හැක. කස්තූරි මුවාට කිසිදු හානියක් සිදු නොවේ. කස්තූරි ගොව්පලවල් ඇති කිරීමෙන් මෙම වටිනා ද්‍රව්‍ය ලබා ගැනීමට පුළුවන.

කස්තූරි ඉතා වටිනා දුලබ ද්‍රව්‍යයකි. මෙහි ඇති සුගන්ධය ඉතා මතරම් ය. විශේෂයෙන් ම අන්තර්ජාතික වෙළෙඳ පොළෙහි වැඩි මිලක් ලබා ගත හැකි ය. කස්තූරි සුවඳ විලවුන් තැනීමේදී විශේෂයෙන් පාවිච්චි කරයි. ඒ අයුරුම මෙහි ඇති වෛද්‍ය විද්‍යාත්මක හා ඖෂධීය වටිනාකම ඉතාමත් අගනේ ය. ආයුර්වේද, යුනානි ටිබට් හි අම්චි හා චීන වෙදකමෙහි බෙහෙවින් යොදා ගනී. ii වන ශතවර්ෂයෙ හි අරාබිවරුන්ගේ වෙදකමෙ හි ද මෙය යොදා ගත් බව සඳහන් වේ. කස්තූරිවල ඖෂධීය වටිනාකම හෘදය ක්‍රියාකාරිත්වයට සහ රුධිර සංසරණයට බෙහෙවින් බලපායි.

කස්තූරි වරක් දෙවා ගැනීමෙන් පසු නැවත ඇතිවන්නේ නැතහොත් ගැටිති පිරීම සිදුවන්නේ මාස 6 කට පසුව ය. මුලු ජීවිත කාලය වන වසර 16 කදී ග්‍රෑම් 360 පමණ ලබා ගත හැකි බව ගණන් බලා ඇත. සතුන් හදා වඩා ගැනීමේ දී කිසිදු කරදරයක් නොමැතිව හෝ මැරීමක් නොමැතිව කස්තූරි ලබා ගත හැක. එක්කෝ නිර්වින්දන ක්‍රියාවක් සිදු කිරීමෙන් හෝ එකතැනක සීරුවෙන් තබා ගැනීමෙන් ලබා ගත හැකි ය.

කස්තූරි මුවා ජීවත් වන ප්‍රදේශවල සතාගේ මූත්‍රා හා මලපහ දේශීය වෛද්‍ය ක්‍රමවල යොදා ගන්නා බව පෙනේ. මේවා වාතරෝග හා කැස්ස ක්ෂය රෝගයට යොදා ගනී. මෙය ජීවිත ආරක්ෂක ඔසුවක් ලෙස පෙන්වා දෙයි. මෙම සතුන්ගෙ සංරක්ෂණය සඳහා වඳ වී යාම වැළැක්වීමට ගත හැකි විශේෂ ම පියවර වන්නේ සතුන් නොමැරීම යි. විශේෂයෙන් ම කස්තූරි සඳහා මැරීම සිදු කරන්නේ පුරුෂ සතා ය. දෙවැනි සංරක්ෂණ පියවර වන්නේ මෙම සතුන් ජීවත් වන පරිසරය විනාශ නොකිරීම ය. ගස් කපා හෙළීම විශේෂයෙන් දැව සංහාරය, අතිකුත් සතුනගේ ආහාරය සඳහා කොළ අතු බිඳ දැමීම නතර කළ යුතු ය. රජය මගින් මෙම පියවර ගෙන ඇතත් පරිසරයේ ජීවත් වන මිනිසුන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ද ක්‍රියාත්මක වීම වටනේ ය. මිනිසුන්ට මේ ගැන අවබෝධයක් ලබා දීම සුදුසු ය. තවත් විශේෂ කරුණක් වන්නේ අසල්වැසි රටවලට කස්තූරි වැනි ද්‍රව්‍ය ගෙන යාම පාලනය කිරීම ය. මේ සඳහා නීතිමය වැඩ පිළිවෙලක් දියත් කළ යුතු ය. බෝ කිරීම සඳහා කස්තූරි මුවන් ඇති කිරීම සඳහා මුව ගොව්පලවල් තැනීමත් ඉතා වැදගත් ය.

සොබාදහම අපට දයාද කර ඇති මෙම සතාගෙන් අප ලබන විශේෂ දෙයක් වූ කස්තූරි වටිනා සම්පතකි. ලෝකයේ සෑම පෙදෙසක ම නැති, විශේෂ පරිසර පද්ධතියකට සීමා වූ මෙම සතාට හිම් ලෝකයේ ඔවුනට හැසිරීමටත් ජීවත් වීමටත් ඉඩ ලබා දුනහොත් සතාටත් ඉන් යැපෙන මිනිසාටත් මහගු ආස්වාදයක් හිමි වේ.


කස්තූරි මුව ගොව්පලක්